**244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.3 |
| | | 2. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.1 |
| | | 3. කාර්යභාරයන් ඉටු නොකිරීම | 2.2.2 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධාන සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද සම්පූර්ණයෙන්මද අප්‍රමාදව එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.5 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියාමනයන් තම දෙපාර්මේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම් | 2.6<br>2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

## 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

--------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් ස්වකීය ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පරිදි අංශ 03 ක් ස්ථාපනය කරන ලදී

01. වෙළඳ ප්‍රතිපත්ති අංශය
02. ආයෝජන ප්‍රතිපත්ති අංශය
03. පරිපාලන, ගිණුම් හා විශේෂ ව්‍යාපෘති අංශය

එම එක් එක් අංශයේ කාර්යයන් සැකෙවින් පහත පරිදි විය.

01. **වෙළඳ ප්‍රතිපත්ති අංශය**

වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති සංශෝධනය කිරීම මෙන්ම වෙළඳාමට, කර්මාන්තයන්ට හා නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාලව විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධ කටයුතු මෙම අංශය යටතේ සිදු කරයි. තවද රේගු පරිපාලනයට අදාල රෙගුලාසි හා අභියාචනා සම්බන්ධයෙන් වූ කාර්යයන් සම්බන්ධීකරණය කිරීමද සිදු කරයි. වෙළඳ අංශය යටතේ ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

I. වෙළඳ ප්‍රතිපත්ති
II. තීරුබදු ප්‍රතිපත්ති
III. නිදහස් වෙළඳ ගිවිසුම්

02. **ආයෝජන ප්‍රතිපත්ති අංශය**

රාජ්‍ය ආයතනවල ආයෝජන සම්බන්ධ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධ වගකීම ආයෝජන ප්‍රතිපත්ති අංශයට අදාළ වේ.

03. **පරිපාලන, ගිණුම් හා විශේෂ ව්‍යාපෘති අංශය**

මානව භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම, පරිපාලන හා මූල්‍ය කටයුතු මෙම අංශයට අයත් වගකීම් වේ.

## 2.2 කාර්යසාධනය

----------------

### 2.2.1 තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

---------------------------------------------

2015-2030 කාලය තුළ ලඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතු වුවද ඒ අනුව 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුළු සැලසුම් හෝ සකස් වී නොතිබුණු අතර 2018 වර්ෂයේ ලිපිලේඛන අනුවද එවැනි හඳුනා ගැනීමක් හෝ සිදු කළ බව නිරීක්ෂණය නොවීය. ඒ අනුව දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අදාළව මූලික අදියරට හෝ එළඹ තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

### 2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 33 ක් ඉටු කළ යුතුව තිබුණත්, වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව, එම කාර්යයන් 33 න් 11 ක් අවසන් කර නොතිබුණි. නියැදි පදනම මත සිදුකළ පරීක්ෂාවේදී ඉටු නොකළ බවට නිරීක්ෂණය වූ කාර්යයන් 04 ක් පිළිබඳ විස්තර පහත දැක්වේ

(අ) රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිවල සඳහන් විධිවිධානයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව තීරු බදු කපා හැරීම්, අත්හැරීම් හා තීරු බදු සහන පිළිබඳ විස්තර රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමට සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කර නොතිබීම.

(ආ) 2017 වර්ෂය තුළ වෙළඳ හා ආයෝජන දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමට දෙපාර්තමේන්තුව මෙතෙක් කටයුතු කර නොකිරීම.

(ඇ) රේගු බදු පනතේ 22 වන වගන්තිය යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ හා ප්‍රතිඅපනයනය කිරීම සඳහා අනුමැතීන් ලබාදීම දෙපාර්තමේන්තුවේ කාර්යයකි. එසේ වුවද, එය සිදුකරන්නේද යන්න පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා ප්‍රතිඅපනයනය නොකරන ලද භාණ්ඩ පවතීනම් ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කිරීම.

(ඈ) රාජ්‍ය ආයතන සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් රේගු බදු ගෙවීමට එම අවස්ථාවේදී ආයතනවල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවනවිට අදාල භාණ්ඩ අප්‍රමාදව නිදහස් කර ගැනීම සඳහා ගෙවිය යුතු රේගු බදු වර්ෂය අවසානයේදී ඉතිරි වූ ප්‍රතිපාදන මගින් ගෙවීමේ එකඟතාවය මත භාණ්ඩ නිදහස් කිරිමට අනුමැතීන් ලබා දීමට අවශ්‍ය විධිවිධාන සැකසීමට කටයුතු නොකිරීම (2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකී හිඟහිටි බදු මුදල රු.මිලියන 19,483.85 ක් වී තිබුණි).

## 2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා සමාලෝචිත වර්ෂයේ තොරතුරුවලට අදාළ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදමේ ස්වභාවය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිවීම | ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| ---------- | ------------------ | ----------------- | --------------- | --------------- | ----------------- |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 831.3 | 750.2 | 81.1 | 9.8 |
| | මූලධන | 3.15 | 1.7 | 1.45 | 46.0 |
| | **එකතුව** | **834.45** | **751.9** | **82.55** | **9.9** |
| 2014 | පුනරාවර්තන | 755.76 | 736.07 | 19.69 | 2.6 |
| | මූලධන | 6.18 | 5.28 | 0.9 | 14.6 |
| | **එකතුව** | **761.94** | **741.35** | **20.58** | **2.7** |
| 2015 | පුනරාවර්තන | 1157.1 | 1156.56 | 0.53 | |
| | මූලධන | 4.67 | 4.45 | 0.23 | 4.9 |
| | **එකතුව** | **1161.77** | **1161.01** | **0.76** | **0.1** |
| 2016 | පුනරාවර්තන | 49.93 | 47.07 | 2.86 | 5.7 |
| | මූලධන | 5.1 | 3.08 | 2.02 | 39.6 |
| | **එකතුව** | **55.03** | **50.15** | **4.88** | **8.9** |
| 2017 | පුනරාවර්තන | 49.73 | 44.92 | 4.81 | 9.7 |
| | මූලධන | 3.2 | 0.71 | 2.49 | 77.8 |
| | **එකතුව** | **52.93** | **45.63** | **7.30** | **13.8** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුල වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.3,900,000 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා ගෙන තිබුණු අතර එම වැඩිවීම සියයට 56 සිට සියයට 94 දක්වා පරාසයක විය.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයක ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.300,000 ම වර්ෂය අවසානයේ වියදම් නොකොට ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයක් සඳහා 2017 පෙබරවාරි 01 දින රු.1,000,000 ක පරිපූරක වෙන් කිරීම් මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර වර්ෂය අවසානයේදී රු. 905,354 ක් එනම් පරිපූරක ප්‍රතිපාදනයෙන් සියයට 91 ක් ඉතිරි වී තිබුණි.

(ඈ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 92 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 24401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.50 | 3.15 | 1.40 | 1.69 | 12.00 | 8.48 |

## 2.5 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/BE1/2/IMP/329/2017 හා 2017 ජනවාරි 09 දිනැති 2017 වර්ෂයේ අක්මුදල් සීමාව තීරණය කිරීම යන මැයෙන් දෙපාර්තමේන්තුව වෙත එවා තිබූ ලිපිය අනුව, මාසික අක්මුදල් සීමාව ,කාර්තුවකට වරක් සමාලෝචනය කර සත්‍ය තොරතුරු වාර්තා කරමින් අක්මුදල් සීමාවන් නිශ්චය කරවා ගැනීමට කටයුතු කල යුතු බව දන්වා තිබුණද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කළ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

## 2.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 2.7 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

දෙපාර්තමේන්තුවේ රථයකට 2017 මැයි 18 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව විගණිත දිනය වන 2018 අප්‍රේල් 04 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම්**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 30.19 ක් වැයකර තිබුණි. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල පඩිනඩි වියදම රු. 642,290 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 09 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 28 | 24 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 12 | 01 |
| | එකතුව | 58 | 47 | 11 |